**ගාල්ල දිස්ත්‍රික්කය ගොවිජන සේවා කාරක සභා 33 - 2023**

**-------------------------------------------------------------------**

## 1. විගණන මතය

**1.1** ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 33 හි 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශන, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ ප්‍රමාණාත්මක ගිණුකම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 58(1) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ගාල්ල දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා කාරක සභා 33 කට අදාළව නිකුත් කර තිබුණු විගණන වාර්තා 33 හි ම තත්ත්වාගණනය කල මතයක් ප්‍රකාශ කර තිබුණු අතර, මේ සඳහා හේතු වී තිබූ ප්‍රමාණාත්මක දෝෂයන් පහත දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන

#### 1.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ඇතුළත්ව ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 09 ක් විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගමනය කර ඒ බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි. | එකඟවෙමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 18 ක් විසින් ගිණුම් වර්ෂය තුලදී මිලදී ගනු ලබන හා ඉවත්කරනු ලබන ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලබන පදනම ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හෙළිදරව් කර නොතිබුණි. | එකඟ වෙමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | - එම - |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 32 ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව මූල්‍ය ප්‍රකාශන වල අන්තර්ගත වියයුතු සංරචකයන් අතුරෙන් ශුද්ධ වත්කම් / හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ඉදිරිපත් කර ඇති ආකෘතිය අනුව ගිණුම් වාර්තා ඉදිරිපත් කර ඇත. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 21 ප්‍රකාරව, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කල යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 53 ප්‍රකාරව රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති මඟින් සන්සන්දනාත්මක තොරතුරු වෙනස් ලෙස | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් ඉදිරිපත් කර ඇති ආකෘතිය අනුව ගිණුම් වාර්තා | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි ඡේද අංක 53 ප්‍රකාරව සංසන්දනාත්මක |

| | | |
|---|---|---|
| අවශ්‍ය කෙරේ නම් හෝ අවසර දී ඇත්නම් හැර මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කෙරෙන සියලුම සංඛ්‍යාත්මක තොරතුරු සඳහා පසුගිය කාලපරිච්ඡේදයේ සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතුය. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගොවිජන බැංකු 30 ක මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මූල්‍ය තත්ත්ව ප්‍රකාශය හා ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයෙහි පෙර වර්ෂයේ තොරතුරු හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරිපත් කර ඇත. | තොරතුරු ඉදිරිපත් කළ යුතුය. |

### 1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 14 ක මධ්‍යස්ථානය පිහිටි ඉඩම සහ කාරක සභා 03 ක ගොඩනැගිලි හා කාරක සභා 03 ක තණකොළ කපන යන්ත්‍ර 05 ක් හා කාරක සභා 04 ක පරිගණක 08 ක් යන ස්ථාවර වත්කම්වල වටිනාකම් තක්සේරු කර ගිණුම් ගත කර නොතිබුණි. | ඉඩම ගොවිජන සේවා මධ්‍යස්ථානයට පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය විසින් වත්කම්වල වටිනාකම් ලබා දුන් පසු ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | ස්ථාවර වත්කම් තක්සේරු කර වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |
| (ආ) | අංක 7/12/4/5 දරන 2021 ජූලි15 දිනැති චක්‍රලේඛයේ 06 වන ඡේදය සහ අංක 7/12/4/5 දරන 2024 ජනවාරි 12 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු ලිපිය ප්‍රකාරව ගොවිජන බැංකුවේ ලාභයෙන් ගොවිජන සේවා කාරක සභාවට සියයට 27 ක්ද නිලධාරී දිරිදීමනා සඳහා සියයට 23 ක්ද වෙන් කල යුතු වුවද ගොවිජන සේවා කාරක සභා 06 ක් එම වෙන් කිරීම් සිදු කර නොතිබුණි. | එකඟ වෙමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 04 ක් විසින් සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.156,322 ක වටිනාකමක් සහිත යල් පැන ගිය තොගයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ඉතිරි තොග ලෙස දක්වා තිබුණි. | යල්පැනගිය තොග කපා හැරීමට කටයුතු කරමි. | රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත අංක 09 හි 44 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ගොවිජන සංවර්ධන කොමසාරිස් විසින් ගොවිජන සේවා කාරක සභා 04 ක් වෙත ණය පදනම මත ලබාදී තිබූ ට්‍රැක්ටරය නැවත ගොවිජන සේවා කොමසාරිස් වෙත භාරදී තිබුණු අතර | ණය ශේෂ නිරවුල් කිරීම සඳහා දිස්ත්‍රික් කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. උපදෙස් පරිදි ඉදිරියේදී කටයුතු කරමි. | ස්ථාවර වත්කම් ඉවත් කිරීමේදී ඒ හා බැඳුණු වගකීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කෙරදේවල ගොවිජන සේවා කාරක සභාව විසින් 2017 වර්ෂයේදී කාරක සභාව සතු කුබෝටා ට්‍රැක්ටරය රු.103,000 කටද, 2018 වර්ෂයේ ට්‍රැක්ටර් ට්‍රේලරයක් රු.21,500 කට හා තල 02 තැටි නගුල රු.28,100 කටද අලෙවි කර තිබුණි. එම ඉවත් කළ වත්කම් වෙනුවෙන් ගොවිංන සංවර්ධන කොමසාරිස් වෙත ගෙවිය යුතු එකතුව රු.1,124,780 ක ණය ශේෂය මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වගකීම් යටතේ දක්වා තිබීම සමාලෝචිත වර්ෂයේදීද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | කෙරදේවල අලෙවි කරන ලද ට්‍රැක්ටරය පිළිබඳ තොරතුරු මධ්‍යස්ථානය වෙත ලිඛිතව ලැබී නොමැත. | |
| (ඉ) | ලබුදූව හා වලහන්දූව ගොවිජන සේවා කාරක සභා සතු ගොඩනැගිලි පිළිවෙලින් රු.6,200,000 කට සහ රු.5,000,000 කට සමාලෝචිත වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර තිබුණු අතර ප්‍රත්‍යාගණන ලාභය ගණනය කිරීමේදී එදිනට වත්කමේ ශුද්ධ අගය වෙනුවට මූලික පිරිවැය සැලකිල්ලට ගැනීම හේතුවෙන් ප්‍රත්‍යාගණන ලාභය රු.370,088 ක් අඩුවෙන් දක්වා තිබුණි. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ප්‍රත්‍යාගණන ලාභය නිවැරදිව ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | ගොවිජන සේවා කාරක සභා 11 ක ජංගම නොවන වත්කම් විෂයන් 31 ක ධාරණ අගය බින්දුවක් ලෙස මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුලත් කර තිබුණි. ඒවා නැවත තක්සේරු කර ගිණුම්ගත නොකිරීම නිසා ජංගම නොවන වත්කම්හි නිවැරදි අගය මූල්‍ය ප්‍රකාශන මඟින් හෙළිදරව් නොවුණි. | එකඟවෙමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | ක්ෂය අවසන් වූ වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (උ) | 2023 දෙසැම්බර් 21 දිනැති 7/5/3/2 දරන ගොවිජන සේවා නියෝජ්‍ය කොමසාරිස්වරයාගේ ලිපිය ප්‍රකාරව පහලගම්භය ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල රු.4,100,000 ක් ලෙස තක්සේරු කර තිබුණද රු.4,325,005 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් ජංගම නොවන වත්කම් රු.225,005 කින් වැඩියෙන් දක්වා තිබුණි. පිනිකහන ගොවිජන සේවා කාරක සභාවෙහි ගොඩනැගිලි රු.2,500,000 ක වටිනාකමකට තක්සේරු කර තිබුණද එය | - 2024 වර්ෂයේ රු.4,100,000 ක ශේෂය අනුව ගැලපීම් කිරීමට කටයුතු කරමි. තවද රු.225,005 ක ශේෂය ප්‍රත්‍යාගණන ගිණුමට මාරු කර එම ශේෂය සහ ක්ෂය වෙන් කිරීම් ශේෂය අතර වෙනස ප්‍රත්‍යාගණන සංචිතය ලෙස ඉදිරියට ගෙන ඒමට කටයුතු කරමි.<br>- ගිණුම් වාර්තාව සකස් කරන අවස්ථාව වන විට තක්සේරු සහතිකයක් හෝ වාර්තාවක් | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුය. |

| | |
|---|---|
| මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට ඇතුලත් නොකිරීම නිසා ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | නොතිබූ බැවින් ගොඩනැගිලි රු. 2,500,000 ක වටිනාකම ගිණුම් ගත කිරීම සිදු නොකළ බව දැනුම් දෙමි. |

### 1.2.3 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාර්තා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 07 ක ගිණුම් විෂයයන් 07 ක මූල්‍ය ප්‍රකාශන අනුව දක්වා ඇති ගිණුම් ශේෂ වටිනාකම හා එයට අදාල අනුරූපි වාර්තා අනුව දක්වා තිබූ වටිනාකම අතර රු.543,564 ක නොසැසදීම් පැවතුණි. | එකඟ වන අතර ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | සැසදීම් සිදු කර අදාළ නිවැරදි කිරීම් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 18ක කාරක සභාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන අනුව කාරක සභාවට ලැබිය යුතු ගොවිජන බැංකු ලාභාංශය හා ගොවිජන බැංකුවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව කාරක සභාවට ගෙවිය යුතු ශේෂය අතර රු. 5,665,225ක වෙනසක් නිරීක්ෂණය විය. | එකඟ වෙමි. ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | කාරක සභාව හා ගොවිජන බැංකුව අතර පවතින නොසැසදීම් කඩිනමින් විසඳා ගැනීමට කටයුතු කළ යුතුයි. |

### 1.2.4 විගණන සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සේවා කාරක සභා 31 ක රු.41,302,369 ක වටිනාකම වූ වත්කම් හා වගකීම් ගිණුම් විෂයයන් 187 කට අදාලව විගණනයට ඉල්ලූ සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා එම ශේෂ විගණනයේ දී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය. | එකඟවෙමි. | යොමුගත වත්කම් හා වගකීම් ගිණුම් ශේෂවලට අදාළ විගණනයට ඉල්ලූ සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

## 1.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි යනාදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **(අ)** | **2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත** | | | |
| (i) | 53(1) වගන්තිය | ගොවිජන සේවා කාරක සභා 03 ක බල ප්‍රදේශයට අයත් කෘෂිකාර්මික ඉඩම් පිළිබඳ ලේඛනයක් පිළියෙල කරනු ලැබ සංශෝධන හා ප්‍රතිශෝධන කර කොමසාරිස් ජනරාල්වරයා විසින් සහතික කර නොතිබුණි. | පරීක්ෂා කර ඉදිරියේදී සිදු කරමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |
| (ii) | 53(4)(අ) වගන්තිය. | සෑම අවුරුදු 03කට වරක්ම කාරක සභාවේ සෑම ලේඛනයක්ම කොමසාරිස් ජනරාල් විසින් පරීක්‍ෂා කර සහතික කල යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 07 ක එසේ සහතික කර නොතිබුණි. | පරීක්ෂා කර ඉදිරියේදී සිදු කරමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |
| (iii) | 56(1) වගන්තිය | සෑම කෘෂිකාර්මික ඉඩමක් සඳහාම නියම කරනු ලබන අක්කර බදු මුදල් සෑම වර්ෂයම මාර්තු 31 දිනට පෙර අයකර අවසන් කල යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 11 ක සමාලෝචිත වර්ෂය අවසානය වන විට රු.1,429,717 ක හිඟ අක්කර බදු ශේෂයක් පැවතුණි. | 2024 වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කරමි. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |
| (iv) | 56 (3) හා 56(4) වගන්ති | ගොවිජන සේවා කාරක සභා 06 ක හිඟ මුදල් ගෙවීම පැහැර හරිනු ලබන ගොවීන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි. | හිඟ බදු අය නොවීමට ඉඩම් රජයේ ව්‍යාපෘති සඳහා පවරා ගැනීම, ඉඩම් කට්ටි වීම, ඉඩම් සඳහා අධිකරණ ක්‍රියාමාර්ග පැවතීම, රක්ෂිත ඉඩම් පැවතීම යනාදී කරුණු හේතු වී ඇත. | ගොවිජන සංවර්ධන පනතේ විධිවිධාන පරිදි කටයුතු කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | දෙපාර්තමේන්තු උපදෙස් ලබා ගනිමින් හිඟ බදු නොගෙවන ලද ගොවීන්ට එරෙහිව නීත්‍යානුකූලව කටයුතු කිරීමට ඉදිරියේදී ක්‍රියා කරමි. | |
| **(ආ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| (i) | මු.රෙ.110 | ගොවිජන සේවා කාරක සභා 06 ක හානි හා පාඩු සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. | හානි පාඩු ලේඛන පවත්වාගෙන යාමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මු.රෙ. 880 සහ අංක 08/2020 හා 2020 ජුනි 25 දිනැති ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය | ගොවිජන සේවා කාරක සභා 30 ක මුදල් හෝ ගබඩා භාරව කටයුතු කරන නිලධාරීන් හා ආදායම් එකතු කිරීමේ කටයුතුවලට සම්බන්ධ රාජකාරී ඉටු කරන නිලධාරීන් විසින් ඇප තැන්පත් කළ යුතු වුවත් ප්‍රාදේශීය නිලධාරී සහ ආදායම් එකතු කිරීමේ නිලධාරීන් විසින් ඇප තැන්පත් කර නොතිබුණි | නිලධාරීන්ගෙන් ඇප තැන්පත් ලබාගැනීමට කටයුතු කරමි. | - එම - |
| **(ඇ)** | **ගොවිජන සේවා කොමසාරිස්ගේ චක්‍රලේඛ** | | | |
| (i) | 1986 ඔක්තෝබර් 21 දිනැති අංක 264 දරන චක්‍රලේඛය | කම්වුටු ගොඩනැගිල්ලේ කාමර කුලියට දී ඇති විවිධ දෙපාර්තමේන්තු සහ ආයතන වෙතින් වර්ෂය ඇතුළත ලැබිය යුතු කාමර කුලී, වර්ෂය අවසන් වීමට හය මාසයකට පෙර එම වර්ෂයේ දෙසැම්බර් මාසය දක්වා අයවිය යුතු කාමර | පෙර සිට පැවත එන ශේෂ සොයා බලා නිවැරදි කිරීමට ඉදිරි ගිණුම් වාර්ථාවේදී කටයුතු කරමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | කුලී වෙනුවෙන් වවුචර් ඉදිරිපත් කර එම කුලී මුදල් අයකර ගත යුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 18 ක එලෙස කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,550,836 ක හිඟ ශේෂයක් පැවතුණි. | | |
| (ii) | 1988 මැයි 27 දිනැති අංක 322(7/10/4/3) දරන චක්‍රලේඛය | ඉඩම් ප්‍රවේණි බදු මුදල් භාරගත් දින සිට දින 14 ක් ඇතුළත අදාළ පුද්ගලයින්ට ගෙවීමට කටයුතු කළ යුතු අතර අවුරුද්දක කාලයක් තුළ මුදල භාර නොගන්නේ නම් ගොවිජන සේවා අරමුදලට බැර කල යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 15 ක සමාලෝචිත වර්ෂය අවසානයට නිරවුල් නොකල රු.372,103 ක ප්‍රවේණි බදු මුදල් ශේෂයක් පැවතුණි. | ගෙවිය යුතුතේ කාටද යන්න හඳුනා ගත නොහැකි දීර්ඝ කාලයක සිට පැවත එන ශේෂ ඉදිරියේදී ගොවිජන සේවා අරමුදලට බැර කිරීමට කටයුතු කරමි. හඳුනාගත් ශේෂ ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (iii) | 1992 අගෝස්තු 03 දිනැති අංක 439/92 දරන චක්‍රලේඛය හා 1995 සැප්තැම්බර් 07 දිනැති අංක 0459/95 දරන චක්‍රලේඛය | එකතු කරනු ලබන අක්කර බදු ආදායමින් සියයට 20 ක් ගොවිජන සංවර්ධන අරමුදලට ප්‍රේෂණය කළයුතු වුවත්, ගොවිජන සේවා කාරක සභා 23 ක සමාලෝචිත වර්ෂය අවසානයට රු.1,505,056 ක් එම අරමුදලට ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී ගෙවීමට කටයුතු කරමි. | - එම - |
| (iv) | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන වුකලේඛයේ 5.6(1) වගන්තිය | ගොවිජන බැංකුව, ගොවිජන සේවා කාරක සභාවේ ඒකකයක් බැවින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතු වුවත්, කාරක සභා 33 ම එසේ කටයුතු කර නොතිබුණි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයෙන් උපදෙස් ලබාදී නොමැත. | - එම - |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේඛ අංක 2016 NFC/FCGvi චක්‍රලේඛයේ 6.4 ඡේදය | සහනාධාර පොහොර වැඩි මිලට විකිණීමෙන් ලද මුදල් රජයේ ආදායමට බැර කළ යුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 03 ක් විසින්, එසේ පොහොර විකිණීමෙන් ලද රු. 229,125 ක් කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | ආදායම් තත්ත්වය යහපත් වූ පසු ගෙවීමට කටයුතු කරමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 02. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ කාරක සභා 21 ක මෙහෙයුම් ප්‍රතිඵල එකතුව රු.3,987,997 ක අතිරික්තයක්ද, කාරක සභා 12 ක රු.1,118,118 ක ඌණතාවයක්ද විය. ඒ අනුව කාරක සභා 33 හි මූල්‍ය ප්‍රතිඵලයෙහි සමස්ථ අතිරික්තය රු.2,869,879 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ සමස්ථ අතිරික්තයේ එකතුව රු.5,882,048 ක් විය. ගොවිජන බැංකු 33 හි සමාලෝචිත වර්ෂයේ අතිරික්තයේ එකතුව රු.15,530,194 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය එකතුව රු.11,276,361 ක් විය.

### 2.2 විශ්ලේෂණාත්මක සමාලෝචනය

(අ) කාරක සභා 21 හි මෙහෙයුම් ප්‍රතිඵලයෙහි අතිරික්තය සඳහා ගෙවතු ආදායම, අක්කර බදු ආදායම, තැන්පතු පොලී ආදායම්, වෙනත් පොහොර විකුණුම්, එළවළු බීජ විකුණුම්, පැල විකුණුම්, බිත්තර වී විකුණුම්, කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන්ට යෙදවීමේ ගාස්තු ආදායම් වැඩිවී තිබීම සහ පොහොර ගැණුම්, පොහොර පරිහරණ වියදම්, මධ්‍යස්ථාන නඩත්තු හා කම්කරු කුලිය ගෙවතු සංවර්ධන වියදම් පහළ යාම බලපා තිබුණි.

(ආ) කාරක සභා 12 හි මෙහෙයුම් ප්‍රතිඵලයෙහි ඌණතාවය සඳහා ගෙවතු ආදායම්, පොහොර පරිහරණ ආදායම්, බිත්තර වී විකුණුම් ආදායම්, වෙනත් පොහොර විකුණුම්, එළවළු බීජ විකුණුම්, පැල විකුණුම් අඩුවීම සහ ගමන් වියදම්, ලිපිද්‍රව්‍ය, තැපැල් හා මුද්‍රණ වියදම්, දුරකථන හා විදුලි වියදම්, පුහුණු වියදම්, තොග කපාහැරීමේ වියදම්, ගොඩනැගිලි ක්ෂය වියදම් වැඩිවීම ඌණතාවය ඉහළ යාමට බලපා තිබුණි.

## 03. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 25 ක් විසින් කාරක සභා පිහිටා තිබෙන එකතුව අක්කර 23 පර්චස් 29 ක ඉඩම් | එකඟ වන බව හා ගොවිජන සේවා මධ්‍යස්ථානය පිහිටි ඉඩම් | කාරක සභාව පිහිටා තිබෙන ඉඩම් පවරාගෙන වටිනාකම තක්සේරු කර |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි. | හා ගොඩනැගිලි පවරා ගෙන වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 142(2) ප්‍රකාරව රජය වෙනුවෙන් එකතු කරනු ලබන මුදල් හැකි ඉක්මණින් ප්‍රතිග්‍රාහක නිලධාරියාට යැවිය යුතු වුවද කෙරදේවල හා කෝදාගොඩ ගොවිජන සේවා කාරක සභා වෙත පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2005 වර්ෂයේදී ලබා දුන් පිළිවෙලින් රු.100,000 හා රු.150,000 ක අත්තිකාරම් මුදල සමාලෝචිත වර්ෂයේදීද පියවීමට කටයුතු කර නොතිබුණි. | එම ශේෂය නිරවුල් කිරීමට කටයුතු කර දෙන ලෙස දිස්ත්‍රික් කාර්යාලය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2021-2023 කාලච්ඡේදය තුළ කාරක සභා 05 ක් වෙත ලද ගොවි පැමිණිලි සංඛ්‍යාව 412 ක් වූ අතර ඉන් 83 ක් සඳහා සමාලෝචිත වර්ෂය අවසාන දින වන විටත් විසඳුම් ලබාදීමට නොහැකි වී තිබුණි. | එකඟ වන බව හා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ගැටළු විසඳීමට කටයුතු කරමි. | ගොවි පැමිණිලි කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 30 ක නිරවුල් නොකර වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එනු ලබන එකතුව රු. 11,834,104 ක් වූ ලැබිය යුතු ගිණුම් ශේෂ 169 ක් හා එකතුව රු. 15,584,061 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 207 ක් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | එකඟවෙමි. ඉදිරියේදී අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරමි. | දීර්ඝ කාලය සිට ඉදිරියට ගෙන එනු ලබන ශේෂ නිරවුල් කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | ගොවිජන සේවා කාරක සභා 09 කට අදාළව වී වගාව සඳහා යෙදවිය හැකි A ශ්‍රේණියේ පුරන් කුඹුරු ප්‍රමාණය අක්කර 2,253 රූඩ් 03 පර්චස් 20 ක් පමණ වන අතර වී වගාව හැර වෙනත් කෙටිකාලීන භෝග වගාවන් සඳහා යෙදවිය හැකි B ශ්‍රේණියේ පුරන් කුඹුරු | එකඟවෙමි. | පනතේ විධිවිධාන ප්‍රකාරව පුරන් කුඹුරු ඉඩම් වී වගාව සඳහා හෝ වෙනත් කාෂිකාර්මික කටයුතු සඳහා යොදවා ගැනීමට |

| | | | |
|---|---|---|---|
| | ප්‍රමාණය අක්කර 881 පර්චස් 12 ක් වී වගාව හෝ වෙනත් වගාවන් සඳහා යෙදවීමට කටයුතු කර නොතිබුණි. | | අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | ගොවිජන සේවා කාරක සභා 15 කට අදාළව හඳුනාගත් වගා නොකරන ලද කුඹුරු ඉඩම් අක්කර 2,588 රූඩ් 01 පර්චස් 25 ක් පමණ සමාලෝචිත වර්ෂයේදී වගා කටයුතු සඳහා යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිසිකලට පොහොර මුදල් නොලැබීමේ ගැටළුව හා පාරිසරික තත්වයන් හේතුවෙන් වගා කල කුඹුරු ඉඩම් ප්‍රමාණය අඩු තත්ත්වයක පැවතුණි. ඉදිරියේදී මේ තත්ත්වයන් මගහරවා ගැනීමට කටයුතු කරමි. | වගා නොකරන ලද කුඹුරු ඉඩම් වගා කරවීම සඳහා කටයුතු කළ යුතුය. |
| (ඈ) | ලබුදූව ගොවිජන සේවා කාරක සභාව රු.382,066 ක මහජන බැංකු ඉතුරුම් ගිණුම් ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ ජංගම වත්කම් යටතේ දක්වා තිබුණද 1999 දෙසැම්බර් 29 දින ගිණුම ශුන්‍ය කර ඇති බව බැංකුව වාර්තා කර තිබුණි. | මේ සම්බන්ධව ගාල්ල දිස්ත්‍රික් නියෝජ්‍ය කොමසාරිස් මගින් ලබා ගන්නා උපදෙස් මත අවශ්‍ය කටයුතු කිරීමට පියවර ගනිමි. | මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ඉතුරුම් ශේෂය භෞතිකව නොමැති වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | ගොවිජන සේවා කාරක සභා 04 ක මුළු අක්කර බදු ඉලක්කය රු.885,600 ක් වූ අතර අක්කර බදු එකතු කිරීම රු.551,626 ක් විය. අක්කර බදු එකතු කිරීමේ ප්‍රගතිය සියයට 52 සිට සියයට 75 තරම් අඩු මට්ටමක පැවතුණි. ඉන් කාරක සභා 03 කට අදාළ වසම් 11 ක මුළු අක්කර බදු ඉලක්කය වූ රු.106,640 න් කිසිදු මුදලක් අයකර ගෙන නොතිබුණි. | ඉදිරියේදී මේ සම්බන්ධයෙන් අවධානය යොමු කර මාර්තු 31 දිනට අක්කර බදු අය කර ගැනීමට කටයුතු කරමි. | හිඟ අක්කර බදු කඩිනමින් අයකර ගැනිමට කටයුතු කල යුතුය. |

**3.3 නිෂ්කාර්ය වත්කම්**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | එකක් රු.32,900 ක් වැයකර මිලදී ගෙන තිබුණු ගොවිජන සේවා කාරක සභා 08 ක් සතු ඇඹිලි සලකුණු යන්ත්‍ර 2020 වර්ෂයේදී සවිකර තිබුණද එම යන්ත්‍ර සමාලෝචිත වර්ෂය වන විට ක්‍රියාවිරහිත වී තිබුණි. ඒ අනුව යන්ත්‍ර මිලදී ගැනීමෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටු වී නොතිබුණි. | එකඟවෙමි. නව යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා කටයුතු සිදු කරමින් පවතී. | අක්‍රිය වූ යන්ත්‍ර අළුත්වැඩියා කර කඩිනමින් භාවිතයට ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ඇත්කඳුර හා කෝදාගොඩ ගොවිජන සේවා කාරක සභා සතු අලෙවිසැල් ගොඩනැගිල්ල | අලෙවි සැලෙහි මූලික පහසුකම් නොමැති බැවින් | අලෙවිසැල් ගොඩනැගිල්ල |

| | | | |
|---|---|---|---|
| | වසර ගණනාවක සිට වසා තබා තිබුණු අතර එම ගොඩනැගිල්ල ප්‍රයෝජනයට ගැනීමට හෝ කුලී පදනම මත ලබාදී ආදායම් ඉපයීමට කමිටුව කටයුතු කර නොතිබුණි. | පවත්වාගෙන යාම සඳහා බදු කරුවන් ඉදිරිපත් වී නොමැත. | ඵලදායී කාර්යයක් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුයි. |
| (ඈ) | අහංගම ගොවිජන සේවා කාරක සභාව තුළ පවතින දැනට භාවිතයට නොගන්නා ට්‍රැක්ටර් ට්‍රේලර් 03 ක් සහ රෝද 04 ට්‍රැක්ටර් 01 ක් වර්ෂ 15 තිස්සේ කාර්යාල භූමියෙහි නිෂ්කාර්යව ගාල් කර තිබීම හේතුවෙන් භාවිතයට ගත නොහැකි මට්ටමට දිරාපත්ව තිබුණි. | අපහරණය සඳහා පරීක්ෂාවක් කර ඇති අතර එහි වාර්තාව අනුව ඉදිරියේදී කටයුතු කරමි. | භාවිතයට ගත නොහැකි වත්කම් මුදල් රෙගුලාසි ප්‍රකාරව අපහරණය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | පිංකන්ද ගොවිජන සේවා කාරක සභාව සතු රු.844,200 ක් වටිනා ඉතිරි කිරීමේ ගිණුම වසර කිහිපයක සිට උපයෝජනයෙන් තොරව පවතින අතර එම ශේෂය වැඩි ප්‍රතිලාභයන් ලබාගත හැකි ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. | පිළිගනිමි. නියෝජ්‍ය කොමසාරිස්තුමාගේ උපදෙස් පරිදි කටයුතු කරමි. | අතිරික්ත අරමුදල් වැඩි ප්‍රතිලාභයක් දෙන ආයෝජන මාර්ග වල යෙදවීමට කටයුතු කළ යුතුයි. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 22 කට අදාළව කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර නිලධාරීන් 116 ක්, සංවර්ධන නිලධාරීන් 08 ක්, මධ්‍යස්ථාන කළමනාකරණ සහකාර නිලධාරීන් 11 ක්, ගොවිජන සංවර්ධන ප්‍රාදේශීය නිලධාරී 01 ක්, කම්කරු 01 ක වශයෙන් තනතුරු පුරප්පාඩුව පැවතුණි. | පුරප්පාඩු සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන්නේ ගොවිජන සංවර්ධන දිස්ත්‍රික් කාර්යාලය මගින් වන අතර ඒ පිළිබඳ දැනුවත් කර ඇත. | කාර්ය මන්ඩල විශ්ලේෂණයක් සිදු කර අවශ්‍ය තනතුරුවල පුරප්පාඩු කඩිනමින් පුරවා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | විධිමත් ස්ථාන මාරු ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක නොවීම නිසා ගොවිජන සේවා කාරක සභා 10 ක් තුළ සේවය කරන කාර්ය මණ්ඩල නිලධාරීන් වසර 09 කට වඩා වැඩි කාලයක සිට එකම මධ්‍යස්ථානයේ සේවය කරමින් සිටින බව නිරීක්ෂණය විය. | ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතු කාර්යභාර්යයකි. | වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.6 ඡේදය | නියමිත දිනට පෙර ගොවිජන සංවර්ධන | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ප්‍රකාරව කිසියම් වර්ෂයකට අදාළ මූල්‍ය ප්‍රකාශන අදාළ මුදල් වර්ෂය අවසාන වී දින 60 ක් තුළ විගණනයට ඉදිරිපත් කළයුතු වුවත් ගොවිජන සේවා කාරක සභා 33 ම සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ දින 12 සිට දින 34 ක දක්වා කාල ප්‍රමාදයකින් පසුවය. | දෙපාර්තමේන්තුව ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය වෙත යොමු කරන ලදී. | |

## 5. ගොවිජන බැංකු

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ගොවිජන සේවා කාරක සභා 15 කට අදාළව සක්‍රීය මට්ටමේ ගොවි සංවිධාන 309 ක් පැවති අතර ඉන් ගොවි සංවිධාන 161 ක් පමණක් ගොවි බැංකුවේ තැම්පතු ආරම්භ කර තිබුණි. | පිළිගනිමි. ගොවි සංවිධාන සතුව ප්‍රමාණවත් අරමුදල් නොමැති වීම හේතුවෙන් තැම්පතු ආරම්භ කර නොමැත. | ගොවි බැංකුව සහ ගොවි සංවිධාන අතර සහයෝගීතාවය වර්ධනය වන ලෙස කටයුතු කළ යුතුය. |
| (ආ) | නියාගම ගොවිජන සේවා කාරක සභාව ගොවි සංවිධානවලට ලබාදුන් ණය මුදල රු.477,970 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුළ ණය එකතු කිරීම් ශුන්‍ය මට්ටමක පැවතුණි. තවද එම ණය ශේෂය තුළ හඳුනා නොගත් රු.5,000 ක ශේෂයක්ද නිරීක්ෂණය විය. | ගොවි සංවිධාන ණය ශේෂය 1999 වර්ෂයට පෙර සිටත් හඳුනා නොගත් ශේෂය 2012 වර්ෂයේ සිටත් පැවත එන අතර නිවැරදි තොරතුරු සපයා ගැනීමට නොහැකි බැවින් ශේෂය කපා හැරීමට 2024 අගෝස්තු 12 දින කමිටු තීරණයක් ගෙන ඇත. | හිඟ ණය මුදල් අයකර ගත යුතුය. |
| (ඇ) | ගොවිජන සේවා කාරක සභා 31 කට අයත් ගොවි බැංකු 31 ක් විසින් ගොවීන් වෙත නිකුත් කර තිබූ ව්‍යාපෘති ණය, කෘෂි ණය හා ලක්ෂයේ ණයවලින් ගොවීන් 1,746 කගෙන් අයවිය යුතු එකතුව රු.33,634,976 ක ණය ශේෂය කල්පසු වී තිබුණි. එම ණය අයකර ගැනීමේ ප්‍රගතිය මන්දගාමී මට්ටමක පැවතුණි. | අදාළ හිඟ ණය අයකිරීමේ කටයුතු විනිශ්චය සභා හා අධිකරණය මඟින් සිදුකිරීමට කටයුතු කරමින් පවතී. | 2012 පෙබරවාරි 29 දිනැති අංක 04/2012 දරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තු චක්‍රලේඛය ප්‍රකාරව වාරික හා පොලී මුදල් අයකර ගත යුතුය. |